•

# නාඩි ශාස්ත්‍රය

පාරම්පරික වෛද්‍ය රසික සංජීව අල්විස්

ජීව ශරීරයේ ප්‍රධානත්වය ගන්නේ හෘදයයි. හෘදයේ හැකිළීම් හා පිබිදීම් යන ද්විත්ව ස්වභාවය අනුව නාඩි ස්පන්දනය වේ. හුස්ම ගැනීමේ දී සිදුවන හැකිළීමත් පිබිදීමත් හේතු කොට ගෙන ඉන් වාතය ඇතුළු වීමත්, පිටවීමත් සිදුවන අතර ඒ අනුව ශරීරයේ රුධිරය ගමන් කිරීම ද සිදු වේ. මෙම රුධිර ධාවනය අනුව නාඩිය සැලේ.

නාඩි පරීක්ෂා කිරීමේ දී රෝගියාගේ විකෘති ව ඇති වා, පිත්, සෙම් යන තිදොස අවබෝධයෙන් විමසිය යුතුය. ඉන් දෝෂය ඇති මඟ සොයා ඥානයෙන් දොස් ඇති මගේ අවහිරතා අනුමාන ඇති ව දැන ගත යුත්තේ පලපුරුද්දෙනි. මෙසේ විමසන නාඩියෙන් ශරීරයේ රෝග පීඩා දැන හඳුනා ගත හැකි අතර ඉන් ප්‍රතිකාර සිදු කළ යුත්තේ කුමකටදැයි තීරණය කර ගත හැක. පුරුෂයාගේ දකුණත ද, ස්ත්‍රියගේ  වමත ද නාඩි විමසීමට සුදුසුයැයි පරම්පරාවේ විශ්වාසය වේ. මෙසේ විමසන නාඩිය වයස ස්ත්‍රියගේ ද පුරුෂයාගේ ද යන වග හා මානසික තත්ත්වය මත වෙනස් වන බව දැනගෙන කටයුතු සිදු කළ යුතුය. මනා සිහියෙන් යුතු ව නාඩි පිරික්සීම ද අප පරපුරේ නීතියකි.

එකනෙහි උපන් දරුවාගේ නාඩි පනස්හයකි. ඉන් පසු නාඩි හතළිහක් වේ. යෞවන කාලයෙහි තිස්හයකි. මහත් වූ පුරුෂයාගේ විසි නවයකි. ස්ත්‍රියගේ ද එලෙස ම ය. මහලු අවධියේ විසි අටකි. ඉතා මහලු අවධියේ තිහකි. මෙසේ නාඩි ඥානය දැනගත යුතුය.

**නාඩි පරීක්ෂාවට සුදුසු රෝගියා**

මළමුත්‍ර පහ කළා වූ සැපසේ හිඳගෙන දණහිස මත අත තබාගෙන සිටින්නා වූ රෝගියාගේ නාඩිය මනා කොට  පරීක්ෂා කළ යුතුය. ජලස්නානය කළ විගස, ආහාර අනුභව කළ විගස, හිස තෙල් ගෑ විගස, බඩගින්නෙන්, ජල පිපාසයෙන් පෙළෙන, නින්දට පැමිණි පුද්ගලයා යන අයගේ නාඩි පරීක්ෂා නොකළ යුතු බව පැරැන්නන්ගේ මතයයි. ඒ මන්දයත් එම නාඩියේ නිවැරදි බව නිර්ණය කළ නොහැකි බැවිනි.

තුන් වරක් අත්ල අල්ලා මුදාහැර නාඩි පරීක්ෂා කරන්නේ රෝග නිර්ණයේ නිවැරදි බව තහවුරු කර ගැනීම සඳහාය. වාතය ද, පිත ද,  සෙම ද යන වග මහපට ඇඟිල්ලේ මුල සිට දකුණතේ ඇඟිලි තුඩු තබා පරීක්ෂා කිරීමෙන් නාඩි අවබෝධය ලබා ගන්නා අතර, මූලික ව ම හඳුනා ගන්නා විකෘතිය දිව, නේත්‍ර, මුත්‍රා, ඍතු ශුද්ධිය පරීක්ෂා කිරීමෙන් පසු රෝග නිර්ණය ස්ථිර කර ගත හැක. තව ද  උදය කාලය, දිවා කාලය හා සවස් කාලය යන කාලයන්හි දී නාඩියේ ස්වභාවය වෙනස් වේ. පිත සම්බන්ධ නාඩිය චපල යැයි ද, වාතය සම්බන්ධ නාඩිය වක්‍ර යැයි ද සෙම සම්බන්ධ නාඩිය මනු යැයි ද අපේ පාරම්පරික මතය වේ. තව ද වා සෙම් එකට එක් වී විකෘති වන නාඩි ද, ඒ හා සම ව එකිනෙක බැඳී විකෘති වන නාඩිය ද රෝග නිර්ණය කරනු ඇත.

මෙසේ රෝග නිර්ණය සඳහා වන නාඩි නිරීක්ෂණය හෙවත් පාරම්පරික ව රැකගෙන එන්නා වූ උතුම් වූ මේ කලාවෙන් රෝග නිර්ණය පමණක් නොව ජීවයේ සාධ්‍යාසාධ්‍යභාවය ද ස්ථිර වශයෙන් ප්‍රකාශ කිරීමේ හැකියාව පරම්පරාවෙන් අපට උරුම ව ඇත. තව ද රෝගියා මරණාසන්න නම් ඔහුගේ මරණය සිදුවන අවස්ථාව ස්ථිර ව නිගමනය කොට ප්‍රකාශ කිරීමට අප නාඩි ශාස්ත්‍රය දක්ෂ බව ප්‍රකාශ කළ යුතුය.

**මර්ම චිකිත්සාව**

ශරීරයේ මර්ම එකසිය අටකි. එනම් පයෙහි එකොළහකි. දෙපයේ මර්ම විසි දෙකකි. දෑතේ ද එලෙස ම විසි දෙකකි. උදරයෙහි හා උරහිසෙහි දොළොසක් වේ. පිටෙහි තුදුසෙක් ද දසරුවන් මත්තෙහි සතිසෙක් ද වේ. මෙසේ ප්‍රධාන මර්ම එකසිට අටකි. ඒ පහත පරිදිය.

1. කක්ෂිප්‍ර මර්ම
2. කූර්ම මර්ම
3. තල හෘද මර්ම
4. ගුල්ප මර්ම
5. කූර්ම සිරා මර්ම
6. ඉන්ද්‍රවස්ති මර්ම
7. ජානු මර්ම
8. ඌර්වි මර්ම
9. අති මර්ම
10. ලෝහිතාක්ෂ මර්ම
11. විටිපා මර්ම
12. මනි සන්ධි මර්ම
13. කූර්ප මර්ම
14. කක්ෂිදර මර්ම
15. නබඩැරස මර්ම
16. වීන වස්ති මර්ම
17. නාසි මර්ම
18. හෘද මර්ම
19. ස්තන මර්ම
20. තනරෝහිත මර්ම
21. පසථ මහා මර්ම
22. අපාංග මර්ම
23. දූවකටිකරු මර්ම
24. වලන්ද මර්ම
25. දෙපාර්ශ්ව සන්ධි මර්ම
26. අතින මර්ම
27. අසිත මර්ම
28. බ්‍රහති මර්ම
29. දයපලක මර්ම
30. දංශ මර්ම

**දසරුවන් මත්තෙහි මර්ම**

1. මත්‍රතා මර්ම
2. කෘකටිකා මර්ම
3. විදුර මර්ම
4. සන්නිපාත මර්ම
5. අපාංග මර්ම
6. සංඛ මර්ම
7. අවර්ත මර්ම
8. උත්ක්ෂේප මර්ම
9. සප්තනි මර්ම
10. සීමන්ත මර්ම
11. ෂිංගාට මර්ම
12. අධිපති මර්ම

මෙසේ කියන ලද මර්ම අතරින් යම් යම් මර්මයන්ගේ ප්‍රමාණයන් හා පිහිටීම් අඟුල් ප්‍රමාණයන් වෙනස් වන අතර ඒ සඳහා ප්‍රතිකාර කිරීමේ දී වෛද්‍යවරයා විසින් කරුණු කාරණා හරිහැටි දැන කටයුතු කළ යුතුය. මර්ම විදීම, ලේ හැරීම, පැලීම, ගිනියම් කිරීම, ක්ෂාර තිබීම, පුහුඩා කැවීම් යන කාරණා නොකළ යුතු මර්ම ද මේ අතර ඇති බව කියන ලදී. ශරීර අභ්‍යන්තරයේ සිට සම දක්වා ද හිසේ සිට දෙපතුල දක්වා සියලු රෝග පීඩා සුව කිරීම සඳහා අප විසින් මර්ම විදීම, පිලිස්සීම, තෙරපීම යන කාරණා සිදු කරමින් ප්‍රතිකාර සිදු කරන අතර මේ සඳහා මර්ම තෙරපීමේ දී ස්නායු උද්දීපනය සඳහා ද, අභ්‍යන්තර දුර්වලතා සමනය සඳහා ද තෛල උපයෝගී කරගනු ඇත. තව ද දෙපතුලේ සහ දෙඅල්ලේ ඇති මර්ම තෙරපා ශරීර අභ්‍යන්තර ඉන්ද්‍රියන්ගේ දුර්වලතා සමනය කළ හැකි අතර අධි රුධිර පීඩනය, දියවැඩියාව වැනි රෝගාබාධ සඳහා ක්ෂණික ප්‍රතිකාර මේ මර්ම තෙරපීමෙන් සිදු කරන අතර අංශයක් හිරිවැටීම පණ නැතිවීම ආදී රෝගවල දී රහස් තෙල් බෙහෙත් උපයෝගී කර ගනිමින් මර්ම තෙරපීම සිදු කර එම දුර්වල වූ කොටස් යලි ප්‍රාණවත් කර නිරෝගී කිරීම ද අප විසින් සිදු කරනු ලැබේ.

මෙම ප්‍රධාන මර්මයන් තවත් බෙදී යන අතර, එය වාත, පිත, සෙම ආදී වශයෙන් වෙන් වෙන් ව හඳුනා ගැනීමෙන් පසු එම තුන්දොස් කිපීම් සමනය කළ හැකි අතර එම ප්‍රතිකාරයන් අප විසින් හඳුනා ගනු ලබනුයේ රෝගියාගේ නාඩි පිරික්සීමෙන් අනතුරුවය. මෙම ප්‍රතිකාර සඳහා උපයෝගී කර ගන්නා උපකරණ රන් හා රිදී උපයෝගී කර සාදා ඇති බැවින් කාලයත් සමග එම උපකරණ භාවිතය අප අතරින් දුරස් වී ගිය ද පාරම්පරික පළපුරුද්ද මත මර්මයක් මත ඇඟිලිතුඩු තැබූ සැනින් රෝග සුව කිරීමේ හැකියාව අප පරම්පරාව තුළ තවමත් නොනැසී පවතින බව ආඩම්බරව කිව යුතුය. මෙම මර්ම තෙරපීම අපගේ පාරම්පරික ව එන සටන් කලා ක්‍රම වේද සඳහා ද උපයෝගී කර ගන්නා අතර එය රහසිගත ව සිදු කරන ක්‍රියාවලියකි.